# කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC)
## පුරප්පාඩු (කොන්ත්‍රාත් පදනම මත)

ශ්‍රී ලංකාවේ පරිගණක හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබාදෙන ප්‍රමුඛ උසස් අධ්‍යාපන ආයතනයක් වන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) විසින් පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් **2026 පෙබරවාරි 16 වන සඳුදා** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** රියදුරු

**<u>අධ්‍යාපනික සුදුසුකම්:</u>**

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය.

**සහ**

2. බර වාහන පැදවීම සම්බන්ධව මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර, රියදුරු බලපත්‍රය ලබාගැනීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**<u>අනෙකුත් සුදුසුකම්:</u>**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
- තනතුරට අදාළ කාර්යභාරයන් නිසි ලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුවය සම්පන්න විය යුතුය
- යහපත් චරිතයකින් යුක්ත විය යුතුය

**වැටුප:** රු. 65,805/- (මූලික වැටුප + ජීවන වියදම් දීමනාව)

**බඳවා ගැනීමේ ක්‍රමය:** සම්මුඛ පරීක්ෂණය හා වෘත්තීය (Trade) පරීක්ෂණයක් මඟින්

**වයස් සීමාව:** අවුරුදු 18 – 45 අතර

**<u>අදාළ කොන්දේසි:</u>**

1. UCSC වෙබ් අඩවියේ (https://ucsc.cmb.ac.lk) ඇති අදාළ මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. ඒ සමඟම, තොරතුරු සම්පූර්ණ කළ අයදුම්පත්‍රයේ පිටපතක් බාගත කර ඔබගේ ජීවදත්ත පත්‍රය (CV) සමඟ **2026 පෙබරවාරි 16 දිනට පෙර** (drest@ucsc.cmb.ac.lk) (නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අංශය) වෙත විද්‍යුත් තැපැල මඟින් යොමු කළ යුතුය.

විද්‍යුත් තැපෑලේ විෂයය ලෙස **"රියදුරු (කොන්ත්‍රාත් පදනම මත)"** යනුවෙන් සඳහන් කළ යුතුය.

1

2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයෙන් පසු ලැබෙන, අසම්පූර්ණ හෝ UCSC වෙබ් අඩවියේ නියමිත ආකෘතියට අනුව ඉදිරිපත් නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය සතුය.

**ඉහත තනතුරට අදාළ වෙනත් ප්‍රතිලාභ:**

i) අර්ථසාධක අරමුදල (University Provident Fund)
සේවකයාගේ වැටුපෙන් 10% ක් හා සේවාදායකයා විසින් 15% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ.

ii) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (Employees' Trust Fund)
සේවාදායකයා විසින් වැටුපෙන් 3%ක් බැර කරනු ලැබේ.

**අධ්‍යක්ෂක**
**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය**
**අංක 35, රීඩ් මාවත,**
**කොළඹ 07.**
**2026.01.28**